**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/2008 (සංශෝධන 11)**

මගේ අංකය: විවැ/චක්‍රලේඛ/2018
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10.
2018.07.17

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**හමුදා සේවා සහ දුබලතා විශ්‍රාම වැටුප ඒකාබද්ධ කර ගෙවීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2008.10.03 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 9/2008 සහ 2010.03.30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 9/2008 (සංශෝධන) යන චක්‍රලේඛයන්ට වැඩිමනත් වශයෙනි.

02. සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයන්හි " දුබලතා විශ්‍රාම වැටුපේ හා සේවා විශ්‍රාම වැටුපේ එකතුව විශ්‍රාම වැටුප ගණනය කිරීමට යොදා ගන්නා වැටුපෙන් 50/60 සීමාව නොඉක්මවිය යුතුය " යනුවෙන් සඳහන් විය.

**එම විධිවිධාන අංක 2053/10 හා 2018.01.08 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය අනුව,**

- **1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය,**

යුධ හමුදා නිලධාරින් සඳහා 19 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව ද, යුධ හමුදා සෙබලුන් සඳහා 28 වන නියෝගයේ (1) ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව ද,

" එසේ වුවද, එකී දුබලතාව හෝ මරණය, යුධ හමුදා සේවාවන් හෝ යුධ හමුදා පනතේ 23 වන හෝ 23 අ වන වගන්ති යටතේ හමුදා රාජකාරී නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට යුධ හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් සහතික කර ඇත්නම්, උක්ත වගන්ති ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය , යුධ හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම් , එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට , වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතුය " ලෙස සංශෝධනය කර ඇත.

- **1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය ,**

නාවික හමුදා නිලධාරීන් සඳහා 16 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව ද, නාවික හමුදා නැවියන් සඳහා 25 වන නියෝගයේ (1) ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව ද,

" එසේ වුවද, එකී දුබලතාව හෝ මරණය, නාවික හමුදා සේවාවන් හෝ නාවික හමුදා පනතේ 21 වන වගන්තිය යටතේ හමුදා රාජකාරී නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් සහතික කර ඇත්නම්, උක්ත වගන්ති ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය , නාවික හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම් , එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට , වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතුය " ලෙස සංශෝධනය කර ඇත.

- **1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය ,**

ගුවන් හමුදා නිලධාරීන් සඳහා 16 වන නියෝගයේ (1) වන ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව ද, ගුවන් හමුදා භටයන් සඳහා 25 වන නියෝගයේ (1) ඡේදයේ (අ) අනුඡේදයට ඉක්බිතිව ද,

" එසේ වුවද, එකී දුබලතාව හෝ මරණය, ගුවන් හමුදා සේවාවන් හෝ ගුවන් හමුදා පනතේ 23 අ වන වගන්තිය යටතේ හමුදා රාජකාරී නොවන ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් සිදු වූවක් බවට ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් සහතික කර ඇත්නම්, උක්ත වගන්ති ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන මුළු විශ්‍රාම වැටුප් ප්‍රමාණය , ගුවන් හමුදා සේවා විශ්‍රාම වැටුපක් වේ නම් , එම විශ්‍රාම වැටුපද සමග එකතු කළ විට , වාර්ෂික වැටුප් ප්‍රමාණයෙන් 100% නොඉක්මවිය යුතුය " ලෙස සංශෝධනය කර ඇත.

02. 2018.01.07 දිනය දක්වා 50/60 සීමාවට යටත්ව සහ 2018.01.08 දින සිට 100% ට යටත්ව ද දුබලතා විශ්‍රාම වැටුපේ ප්‍රමාණය තීරණය කර විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/2008 හි උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

03. ඒ අනුව පහත දක්වා ඇති අවස්ථාවලදී මෙම සීමාවන්ට යටත්ව දුබලතා විශ්‍රාම වැටුපේ ප්‍රමාණය තීරණය කළ යුතු වේ.

- ප්‍රථම වරට දුබලතා විශ්‍රාම වැටුප සමඟ සේවා විශ්‍රාම වැටුප ප්‍රදානය කිරීමේදී,
- දුබලතා විශ්‍රාම වැටුප සමඟ ගෙවන සේවා විශ්‍රාම වැටුප සංශෝධනය (වි.වැ.ච.6/2010, 10/2011 හා ඊට සබැඳි ) /ප්‍රතිශෝධනය (වි.වැ.ච. 3/2009, 15/2012 හා ඊට සබැඳි) වන අවස්ථාවක,
- දුබලතා විශ්‍රාම වැටුප සමඟ ගෙවන සේවා විශ්‍රාම වැටුප වි.වැ.ච. 2/2006, 5/2015 (II) අනුව විශ්‍රාම වැටුප් ගැලපීමේදී,
- සංශෝධිත සේවා විශ්‍රාම වැටුප් ප්‍රදානය සමඟ දුබලතා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේදී,

I. **2006.01.01 ට පෙර විශ්‍රාම ගන්වනු ලැබූ විශ්‍රාමිකයන් ( 2006.01.01 ට පෙර ක්‍රියාත්මක වූ වැටුප් ක්‍රමයක් යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කර ඇති විශ්‍රාමිකයන් )** විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/2008 හි උපදෙස්වලට යටත්ව සේවා විශ්‍රාම වැටුප ප්‍රදානය කිරීමට අදාල කරගත් වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වීමට පෙර විශ්‍රාම වැටුප් පරිවර්තනය දක්වා ගණනය කළ දුබලතා විශ්‍රාම වැටුප යොදා ගනිමින් ඉහත දැක්වූ පරිදි 50/60 සහ 100% සීමාවට යටත්ව දුබලතා විශ්‍රාම වැටුපේ ප්‍රමාණය ගණනය කළ යුතුය.

II. **2006.01.01 න් පසු විශ්‍රාම ගන්වනු ලැබූ විශ්‍රාමිකයන් ( 2006.01.01 න් පසුව ක්‍රියාත්මක වූ වැටුප් ක්‍රමයක් යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කර ඇති විශ්‍රාමිකයන් )** විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/2008 හි අංක 4 ඇ හි සඳහන් උපදෙස්වලට යටත්ව පරිවර්තනය කළ දුබලතා විශ්‍රාම වැටුප පදනම් කරගෙන ඉහත දැක්වූ පරිදි 50/60 සීමාව සහ 100% යටත්ව දුබලතා විශ්‍රාම වැටුපේ ප්‍රමාණය ගණනය කළ යුතුය. (දුබලතා විශ්‍රාම වැටුප මසකට රු.152.00ට වඩා අඩුවන සෑම අවස්ථාවක වි.වැ.ච 9/2008 අනුව පරිවර්තනය කළ පසු දුබලතාවය රු. 4404.97 ක් වේ.) වැඩිපුර ගෙවීම් අයකිරීම හා හිඟ ගෙවීම් සම්බන්ධව උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය.

III. එසේ තීරණය කළ දුබලතා විශ්‍රාම වැටුපේ ප්‍රමාණය, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/2008 ට අනුව පරිවර්තනය කළ දුබලතා විශ්‍රාම වැටුප නොඉක්මවිය යුතුය.

IV. 2006.01.01න් පසු විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයින්ගේ මූලික විශ්‍රාම වැටුප හා දුබලතා විශ්‍රාම වැටුප දත්ත පද්ධතිය තුල BPEN හා DSA යටතේ වෙන්කර දැක්විය යුතුය. දීමනා ලබාදීමේදී දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් පිලිපැදිය යුතු වේ .

04. මෙම උපදෙස් නිකුත් කිරීමත් සමගම නව දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් මධ්‍යගතව සිදුකරනු ලැබේ.

05. සේවා කාලය සම්පූර්ණ නොවූ විශ්‍රාමිකයන් සඳහා 59 කාණ්ඩය යටතේ ගෙවන ලද සේවා විශ්‍රාම වැටුප් සංශෝධනයට ලක් කරනු නොලැබේ. එහෙත් දුබලතා විශ්‍රාම වැටුප් අංකය අවලංගු කර (ගෙවීම් නතර කර) එම දුබලතා විශ්‍රාම වැටුප ද , 59 කාණ්ඩයේ ඇති මූලික විශ්‍රාම වැටුප සමඟ දුබලතා විශ්‍රාම වැටුප , දත්ත පද්ධතිය තුල BPEN හා DSA යටතේ වෙන්කර දැක්විය යුතුය. දීමනා ලබාදීමේදී දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් පිලිපැදිය යුතු වේ .

06. මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය මත නිකුත් කෙරේ.

**ඒ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාමවැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:**

| | | |
|---|---|---|
| 1. | ලේකම් - රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. |
| 2. | ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - එම |
| 3. | ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය | - එම |
| 4. | ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - එම |
| 5. | ත්‍රිවිධ හමුදාධිපතිවරුන් | - එම |
| 6. | විගණකාධිපති | - එම |